## හබරකඩගේ ඇලෝසියස් පෙරේරා නම් වූ අද්විතීය රංග ශිල්පියා පිළිබඳ සැමරුම් සටහනක්



# එච් ඒ

වරෙක ඔහු මට පියකු විය. වරෙක ගුරුවරයකු විය. වරෙක සොඳුරු ආශ්‍රාදායකයෙකි. වරෙක මට වැඩිමහල් සොයුරකු විය.

70දශකයේ තම කලා කටයුතු ආරම්භ කළ - ධම්ම ජාගොඩගේ රංග ශිල්ප ශාලිකාවේ දීප්තිමත් රංග ශිල්පියකු වූ - හත්තෙට්ටුවේගම ශූරින්ගේ මග පෙන්වීම යටතේ වීදි නාට්‍ය ක්ෂෙත්‍රයට හා වේදිකා නාට්‍ය ක්ෂෙත්‍රයට අනුපමේය සේවයක් කළ එච් ඒ පෙරේරා නම් වූ සොඳුරු කලා ශිල්පියා අප අතරින් වෙන්වීම ශ්‍රී ලාංකේය කලා කෙතට සපුරා ගත නොහැකි තරමේ අඩුපාඩුවක් බව අමුතුවෙන් කිව යුතු නැත .

එච් ඒ පෙරේරා නමැති සහෘද කලා කරුවා මගේ ජීවිතයට සමීප වූයේ වරෙන්තු නාට්‍යය සමගිනි. 1995 වසෙරේ ඔහු විසින් අධ්‍යක්ෂණය කරනු ලැබූ වරෙන්තු නාට්‍යයේ පොලිස් අධිකාරිවරයාගේ

**ශ්‍රීනාත් මද්දුමගේ**

චරිතයට මා තෝරා ගනිමින් ඔහු මා කෙරේ තැබූ විශ්වාසය ම මහත් වූ ශක්තියක් කොට ගනිමින් එම චරිතයට පණ පෙවීමට මා ගත් උත්සාහය මැනවින් හඳුනා ගෙන රංගනය කෙරෙහි මා තුළ කිසියම් වූ හැකියාවක් තිබුණේද එය කපා කොටා ඔප මට්ටම් කර ඔහුට අවශ්‍ය වූ ආකාරයට එම චරිතය ගොඩ නංවාගන්නට ඔහු කළ කැපවීම නිසාවෙන් 1995 වසරේ හොඳම සහය නලුවාට හිමි රාජ්‍ය සම්මානය කරා මා කැඳවාගෙන යන්නට ඔහු සමත් විය.

කලා ක්ෂෙත්‍රයේ බොහෝ ප්‍රවීණ නාට්‍ය වේදීන්ට පිහිටා නොමැති විශිෂ්ට වූ ගුණාංගයක් ඔහු සතු විය. එනම් රංගනය පිළිබඳ ගුරුහරුකම් දීමේ මහා හැකියාවයි. තම ගෝල බාලයන් ගේ දක්ෂකම් මෙන්ම දුර්වලකම් ද මනාවට හඳුනාගැනීමේ අපූරු හැකියාවක් ඔහු සතු වූ අතර ඔහු පරිවර්තනය කරමින් අධ්‍යක්ෂණය කළ වරෙන්තු නාට්‍යය 1995 වසරේ රාජ්‍ය සම්මාන 9 ක් දිනා ගැනීම ම ඔහුගේ ප්‍රති.භාව මනාවට පිළිබිඹු කරන්නකි.

මා ශ්‍රී ලංකාවේ මත්පැන් මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානයේ රැකියාව කරන අවධියේ කුරිරු යුද්ධය උච්ඡතම අවධියකදී මායිම් ගම්මාන වල ජීවත් වූ පවුල් වල දරුවන්ට යුද්ධයේ භීෂණයෙන් මදකට හෝ මිදී කිසියම් හෝ මානසික සහනයක් ලබා ගන්නට හැකිවන ආකාරයේ නාට්‍ය වැඩ මුළු කීපයක් සංවිධානය කරන්නට මම උත්සුක වූයෙමි. එම අවස්ථාවේදී එම වැඩ මුළුවලට සහභාගි වන්නට තම කැමැත්තෙන් ඉදිරිපත් වූයේ එච් ඒ පෙරේරා සහ වසන්ත විට්ටච්චි යන කලා කරුවන් දෙදෙනා පමණකි. එම වැඩසටහන් අපට ඉතා සාර්ථකව කරගන්නට හැකි වූ අතර භීෂණයේ පීඩනය හිස මත දරාගත් එම දරුවන් ක්‍රියාකාරී ලෙස එම වැඩ මුලුවලට සහභාගි කරවාගෙන ඔවුන්ගේ හැකියාවන් හඳුනා ගන්නට හා ඔවුනට අවස්ථාවක් ලබාදෙන්නට අප දැරූ උත්සාහය පිලිබඳව එච් ඒ සැමදිනකම සතුටු විය. එච් ඒ පෙරේරා එවැනි මිනිස් ගුණාංග වලින් පරිපුන් මිනිසෙකි.

එච් ඒ පෙරේරා ගේ එකම අභිප්‍රාය වූයේ නාට්‍ය රංගශිල්ප ශාලිකාවක් තැනීමයි. එහෙත් එම සිහිනය ඔහුගේ ජීවිත කාලය තුළ දී ඉෂ්ඨ කර ගන්නට නොහැකි විය. ඔහු වැඩ මුලු පැවැත්වූයේ පිළියන්දල ප්‍රදේශයේ ඔහු ගොඩ නගා ගත් ඔහුගේ පෞද්ගලික නිවසේ ය. එසේ කළේ කිසිදු ලාභ ප්‍රයෝජනයක් නොලබාය. කලාව වාණිජ කරණයට වමින් පවතින යුගයක මෙවන් රංගධරයන් බිහිවන්නේ ජාතියේ වාසනාවට ය.

එච් ඒ පෙරේරා ගේ රංගන මහැකියාව ගැනු මුතුවෙන් යමක් කිව යුතු නැත . මක්නිසාද යත් වේදිකාවේ හෝ ටෙලි නාට්‍ය ක්ෂෙත්‍රයේ හෝ රිදී තිරයේ හෝ ඔහු රඟ පෑ චරිත රසික සිත්සතන් තුළ සදා නොමැකන චරිත බවට පත් කරන්නට ඔහු සැමදා සමත් වූ බැවිනි. රංගනයෙන් දායක වූ වේදිකා නාට්‍ය අතර සෙක්කුව උත්තමාවි ගැලිලියෝ හිට්ලර් සුබ සැන්දෑවක් ජූලියස් සීසර් කලිගුලා වරෙන්තු විශේෂ වෙයි. දූ දරුවෝ නෑදෑයෝ සිටුවරයෝ බුමුතුරුණු යශෝරාවය සහ මෑතක ජනප්‍රිය ටෙලිනාට්‍යයක් වූ මුතු කිරිල්ලි ආදී ටෙලි නාට්‍ය ඔහුගේ රංගන ප්‍රතිභාව මනාව පෙන්නුම් කරයි. එමෙන්ම රිදී තිරයේ කෙළිමඩල සාගර ජලය කොටි වලිගය ඔහු රඟ පෑ චරිත අපේ හදවත් තුළ සදා සනිටුහන් වී ඇති බව මට විශ්වාසය.



නෑදෑයෝ ලේ නාට්‍යයෙන්





එපමණක් නොව එච් ඒ සංගීතය පිළිබඳ මනා දැනුමක් ඇති කලාශිල්පියකු විය. නුඹ විතරක් තලඑළලුයි හිට්ලර් වරෙන්තු නාට්‍ය වල සංගීත අධ්‍යක්ෂණයෙන් දායක වූ ඔහුට ඒ සඳහා සම්මාන පවා හිමිවිය.

එච් ඒ ගේ සමුගැනීම් වෙනුවෙන් ලියවී තිබුණ සටහන් අතරින් මගේ සිතට කා වැදුණ එක් සටහනක් වූයේ -නොවිකුණුනු කලාකරුවා" යන්නයි. ඇත්තෙන්ම ඔහු විකිණුනේ නැත . මුදල් හෝ තනතුරු පසුපස හඹා ගියේ නැත.

කලාව හා දේශපාලනය පිළිබඳ ඔහු දැරූ මතිමතාන්තර වෙනස් කිරීමට මුදලට හෝ බලයට හැකි වූයේ නැත. කිසිදිනෙක එළිපිට දේශපාලනය කතා නොකළද ඔහු තුළ ඒ විෂයය පිළිබඳ මනා පරිචයක් තිබුණි. වරෙන්තු නාට්‍යයේ ඔහු විසින් රචිත පහත දැක්වෙන දෙබස් ඛණ්ඩය එයට හොඳ උදාහරණයකි.

**උන්මාද -**
ප්‍රජාතන්ත්‍රවාදය ... මේ වගේ බල්ලන්ගෙ සේවය ඕනෙ මොන විදියේ ප්‍රජාතන්ත්‍රවාදයකටද කියල ඇයි ඔබෙන්ම අහන්නැත්තෙ මිස් ෆෙලෙති. ..? මම කියල දෙන්නම්.. ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාය එළියෙන් එන සීතල ඇතුලට නොඑන මානුශික අයිතිවාසි-කම් කියන තුනී හම පොරවාගෙන ඉන්නවා.. නමුත් ඇතුළෙන් රත් වෙන්න පටන් ගත්තම පාලක පන්තියේ කුණු ගඳගහන කුමන්ත්‍රණ වලට අපේ ඉල්ලීම් යටපත් කරන්න බැරි වුණාම ජනතාවගෙන් බාගයක් පින් දීමනා පෝලිම් වලට ඇදලා දාලා තමන්ගේ ලාබය තියාගන්න අනික් බාගයම පඩි කැපිලි වලින් මිරිකලා දාලා තව දුරටත් දෙන්න පොරොන්දු නැති වුණාම ඔහෙලා වගේ ප්‍රතිසංස්කරණවාදීන්ට උන් වෙනුවෙන් ජනතාව සන්සුන්ව තියාගන්න බැරි වුනාම උන්ගෙ හම ඉවත් කරලා ඔහෙලව කුණු ගොඩට විසි කරලා දානවා.. ඉන් පස්සේ උන්ගෙ දරුණුම වල් බල්ලො ටික අපේ ඇඟට උසිගන්වනවා උන් චිලියෙදි කලා වගේ...

**ෆ්ලෙති -**
චිලී බෙදවාචකයෙයි මේකෙයි කියෙන සම්බන්ධය මොකක්ද.?

**උන්දමාද -**
තමන්ගෙ ස්වාධීනත්වය තමන්ට සුදුසු ධනවාදී ආර්ථික ක්‍රමයක් වෙනුවෙන් පෙනී සිටින ඕනෑම රටකට ජාතියකට ආණ්ඩුවකට ජනතාවකට පන්තියකට විරුද්ධව ඇමරිකාව මුල් වෙලා ඩොලර් බිලියන ගණන් වැය කරලා කරලා තියෙන.. කරන්න ලෑස්ති.. කුමන්ත්‍රණ ගැන සීතල යුද්ධය ගැන හොඳම උදාහරණයක් ඒක.. ධනේවර ප්‍රජාතන්ත්‍රවාදය ඇතුලෙන්ම එහි ස්වරූපය ටිකෙන් ටික වෙනස් කළ හැකියි කියන විකාර මතයෙන් කියන්නෙ ධනපති රාජ්‍යය විනාශ නොකර කම්කරු පන්තියට විමුක්තිය දිනාගත හැකියි කියලයි. එතෙක් ඇමරිකාව ප්‍රමුඛ ලෝක නව අධිරාජ්‍යවාදය ඔහේ බලා ඉඳියි කියලයි...

එදා වරෙන්තු නාට්‍යයට මා තෝරාගත් දින සිට මේ දක්වා වූ මගේ රංගන දිවියේ මගේ හැකියාවන් ඔප මට්ටම් කර ගැනීමට එච් ඒ පෙරේරා නම් වූ රංගධරයාගෙන් මා ලැබූ ආභාශය හා ගුරුහරුකම් අති මහත්ය. ගුරු මුෂ්ඨියක් නොමැතිව මා වෙත මෙන්ම තවත් බොහෝ අය වෙත දායාද කළ ශිල්පීය නිපුනත්වය බොහෝ කාලයක් ලක් කලා කෙතේ බීජ වපුරමින් අසුවනු නෙළනු ඇත.

දයාබර එච් ඒ. ඔබ සතු වූ උතුම් මිනිස් ගුණාංගද රැගෙන සුවහසක් රසිකයන් ගේ සිත් සතන් සුවපත් කරන්නට නැවත අප අතරම ඉපදෙන්නට යයි මගේ පැතුමයි.